# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1998/33 – 2016 දෙසැම්බර් 23 වැනි සිකුරාදා – 2016.12.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2016 අංක 297 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/15/2016/වීඊ/249.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:
ඒආර්ඒ/එල්එන්ඩී/ඒසීකිව්වීඅයි/ඩී3/32(1).

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

2016 දෙසැම්බර් මස 15 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.**– ප්‍රාදේශීය ලේකම්, අරනායක.

2. **ඉඩමේ විස්තරය.**– සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගන්හත පළාත සුළු කොට්ඨාසයේ අංක 45 ඩී, නාරංගම්මන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, නාරංගම්මන ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක කේජ්/ඒආර්එන්/2016/245 සහ 2016.11.11 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් සහ ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

**01. කැබලි අක්ෂර 'ඒ' – අඹදෙනියවත්ත (ගැවිලිපිටිය කොටස) – ප්‍රමාණය: හෙක්. 4.2271**

උතුරට: මාර්ගය සහ අඹදෙනියවත්ත; නැගෙනහිරට: මාර්ගය; දකුණට: වසන්තගම සහ මාර්ගය; බටහිරට: මාර්ගය.

---

01 - 181

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2016 අංක 298 දරන ආඥාව**

මගේ යොමු අංකය: එල්ඩී/05/2004/ඩී/57.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 4/1/5/15.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 (අ) වැනි වගන්තිය යටතේ ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම පහත සඳහන්


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

2016 දෙසැම්බර් මස 09 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
අංක 1200/6,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.**– ප්‍රාදේශීය ලේකම්, කුරුණෑගල.

2. **ඉඩමේ විස්තරය.**– වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තිරගන්දහය කෝරළේ බටහිර සුළු කොට්ඨාසයේ, අංක 805 වැහැර නැගෙනහිර වසම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වැහැර ගමේ පිහිටි කුරුණෑගල දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක කු. 2268 සහ 2011.11.17 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 1 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0981 ක් යුක්ත ඉඩම් කොටසට මායිම්.

01. **කැබලි අංක 1 – වැහැරවත්ත නොහොත් ලින්ක්වුඩ්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0981**

උතුරට: මු.පි.කු. 1564 හි කැබලි අංක 5453 සහ මු.පි.කු.733හි කැබලි අංක 1; නැගෙනහිරට: මු.පි.කු. 733හි කැබලි අංක 1 සහ මු.පි.කු. 1564 හි කැබලි අංක 62; දකුණට: මු.පි.කු.1564හි කැබලි අංක 60; බටහිරට: මු.පි.කු. 1564 හි කැබලි අංක 55 සහ 54.

01 - 182

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

1987 අප්‍රේල් මස 29 වැනි දින අංක 451/15 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 1987 අංක 133 දරන ආඥාවේ කැබලි අංක 1 සිට 28 ලෙස සඳහන් ඉඩම් කොටස් සම්පූර්ණයෙන් ම රජය සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, එකී ඉඩම් කොටස් අතුරින් පහත උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 03/ජේ/84/යූඩීඒ/238.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: ව/18/3/2/6/12/627.
2016 දෙසැම්බර් මස 15 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
අංක 1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ කැළණිය, වත්තල උප දිසාපති කොට්ඨාසයේ පැලියගොඩ, පැලියගොඩ පට්ටිය, තෙලඟපාත ගමේ (කොට්ඨාස අංක 1 බඩහැලවත්ත, කොට්ඨාස අංක 2 පැලියගොඩවත්ත, කොට්ඨාස අංක 3 පැලියගොඩ පට්ටිය, පැලියගොඩ නගර සහා සීමාව තුළ කොට්ඨාස අංක 4, තෙලඟපාත වත්තල, මාබෝලේ නගර සභා සීමාව තුළ) පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද මු.පි.ගම් 1601 හා 2004.10.23 දිනැති සංශෝධිත මූලික පිඹුරේ සවිස්තරව පෙන්නුම් කර ඇති පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 51 – දන්ගහවත්ත නොහොත් පට්ටිය, පන්සල පිටුපස්සේ කුඹුර, වරි. අංකය සොයාගත නොහැකිය – ප්‍රමාණය: හෙක්. 0.076**

උතුරට: ශ්‍රී සුධර්මාරාම මාවත සහ කැබලි අංක 53; නැගෙනහිරට: කැබලි අංක 53 සහ 52; දකුණට: කැබලි අංක 52 සහ මු.පි.කො. 4340 හි කැබලි අංක 5; බටහිරට: මු.පි.කො. 4340 හි කැබලි අංක 5 සහ ශ්‍රී සුධර්මාරාම මාවත.

01 - 183

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

1997 මැයි මස 26 වැනි දින අංක 997/2 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 1997 අංක 143 හා 1997.05.14 වැනි දින දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, පහත උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස මෙම නියමය මගින් අවසතු කරමි.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 13/97/අයිඩී/57.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: 3/2/ඉඅත්/117.
2016 දෙසැම්බර් මස 16 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
අංක 1200/6,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සීතාවක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අවිස්සාවේල්ල කොට්ඨාස අංක 03 - කඩවිදිය සීතාවකපුර නගර සභා සීමාව තුළ ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/HNW/2015/199 හා 2015.09.01 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව පෙන්නුම් කර ඇති පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අංක 03 – ආතර්ගීල්ඩ්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0006**
උතුරට: ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හිමිකම් කියන ආතර්ගීල්ඩ්වත්ත; නැගෙනහිරට: කැබලි අංක 2 සහ 5; දකුණට: කැබලි අංක 5; බටහිරට: කැබලි අංක 4 සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හිමිකම් කියන ආතර්ගීල්ඩ්වත්ත.

02. **කැබලි අංක 05 – ආතර්ගීල්ඩ්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0760**
උතුරට: කැබලි අංක 4, 3 සහ 2; නැගෙනහිරට: කැබලි අංක 1 සහ 6; දකුණට: කැබලි අංක 6; බටහිරට: කැබලි අංක 6 සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හිමිකම් කියන ආතර්ගීල්ඩ්වත්ත.

03. **කැබලි අංක 06 – ආතර්ගීල්ඩ්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0257**
උතුරට: කැබලි අංක 5; නැගෙනහිරට: කැබලි අංක 1 සහ 7; දකුණට: කැබලි අංක 7; බටහිරට: කැබලි අංක 7 සහ 5.

04. **කැබලි අංක 07 – ආතර්ගීල්ඩ්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0928**
උතුරට: කැබලි අංක 8, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හිමිකම් කියන ආතර්ගීල්ඩ්වත්ත සහ කැබලි අංක 6; නැගෙනහිරට: කැබලි අංක 6, 1 සහ 8; දකුණට සහ බටහිරට: කැබලි අංක 8.

01 - 184

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.